# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,237 — 1936ක්වූ ජූලි මස 31 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### උපාඩ්ග නීති.

"බල්ලන් ලියාපදිංචිකිරීම සම්බන්ධ 1901කේ ආඥාපණත."

1901කේ අංක 25 දරන ආඥාපණතේ 5වෙනි, 6වෙනි වගන්ති යටතේ පුත්තලම සහ හලාවත දිස්ත්‍රික්කුවල සනීපාරක්ෂක සභාවල් විසින් සම්පාදනයකරනලද උපනීති.

ඒ. ඒ. ක්‍රිස්ටෝපල්ස්,
සභාපතිතුමා.

වම් 1936ක්වූ ජූලි මස 20වෙනි දින
පුත්තලම් කච්චේරියේදිය.

උපනීති.

1. පුත්තලම් සහ හලාවත දිස්ත්‍රික්කුවල සනීපාරක්ෂක සභාවලට අයත් කුඩා නගරවල සීමාතුළ තබාගෙන සිටින සෑම බල්ලා හෝ බැල්ලී ගැන ඒ සතා රැකබලාගන්නා එසේ නැත්නම් අයිතිකාරව ඉන්නා අය විසින් ශත 50ක් බැල්ලියෙකුට සහ ශත 25ක් බල්ලෙකුට ලියාපදිංචිකිරීම සඳහා අවුරුදුපතා ගෙවන ගාස්තුවක් වශයෙන් ගෙවිය යුතුයි. මේ ව්‍යවස්ථාව උදෙසා අවුරුද්ද ගණිනු ලබන්නේ එක් අවුරුද්දක අප්‍රේල් මාසයේ 1වෙනිද සිට ඊළඟ අවුරුද්දේ මාර්තු මස 31වෙනිද වනතුරුය.

2. ලියාපදිංචිකිරීමේ ගාස්තු අයකිරීම සඳහා සනීපාරක්ෂක සභාවල සභාපතිතුමා විසින් පත්කොට සිටින (මෙහි මින්මතු අයකරු යනුවෙන් හඳුන්වන) තැනැත්තාට එක් එක් අවුරුද්දේ ජනවාරි මාසයේ 31වෙනිදට මතෙතන් නගරය ඇතුළත සෑම ගෙදරකම වාසයකරන්නකු විසින් ඒ ගෙදර හෝ ගෙදරට ඇතුළත් අවට භූමියකි හෝ තබාගෙන සිටින එක් එක් බල්ලා හෝ බැල්ලිය සම්බන්ධව විස්තර කරුණු මීට යාකොට තිබෙන A ආකෘතිපත්‍රයෙහි වුවමනාකරන පරිද්දෙන් සපයාදිය යුතුයි.

3. යටකී අයකරුට හෝ සනීපාරක්ෂක සභාවල කන්තෝරුවට හෝ නියමිත අයමුදල ගෙවූවිට B ආකෘතිපත්‍රයෙහිවූ පරිද්දෙන් ලියාපදිංචිකළ බවට සහතිකයක් දෙනුලැබේ.

4. (1) යම් බල්ලෙක් හෝ බැල්ලියක් ඉදින් :—

(a) අනික් බල්ලන්වද බෝවිය හැක්කේයයි අයකරු කල්පනාකරන ප්‍රමාණයකට රෝගයකින් පෙළේ නම් හෝ,

(b) වයස, ලෙඩ, තුවාල යන මෙයින් කිසිවක් නිසා තවත් ජීවත්ව සිටින්ට සුදුසු නැතැයි තමන්ට කල්පනා වේනම්, එබඳු බල්ලකු හෝ බැල්ලියක් සඳහා ලියාපදිංචිකිරීමේ සහතිකයක් නොදෙන්නට අයකරුට පුළුවන, නැතහොත් :

(2) අයකරු මැනවයි සලකන කොයිම නියමයකට නමුත් යටත්කොට සහතිකයක් දෙන්නටද ඔහුට පුළුවන. එසේ සහතිකය නොදී හැරීම ගැන හෝ නියමයන්ට යටහත් කිරීම ගැන නොසතුටුවූ බල්ලන් අයිතිකාරයකුට ඊට විරුද්ධව සභාපතිතුමා වෙත පැමිණිලිකරසිටින්නට පුළුවන. එවිට එසේ නොදීහැරීම හෝ නියමයන්ට යටහත්කිරීම ස්ථිරකරන්නට හෝ මදක් වෙනස්කරන්නට හෝ අවලංගුකරන්නට හෝ සභාපතිතුමාට පුළුවන.

5. ලියාපදිංචිකිරීමේ සෑම සහතිකයකම පහත සඳහන් නියමයන් මුද්‍රණයකොට තිබිය යුතුයි, ඒ නම් :—

(a) සභාපතිතුමාගේ කල්පනාවේ හැටියට තවත් ඉදිරියට ජීවත්ව සිටීමට සුදුසු නොවන අන්දමට බල්ලා තුවාලව හෝ රෝගාතුරව සිටීනම් එක්කෝ,

(b) ඒ බල්ලාගේ අයිතිකාරයා උගේ නිතිපතා හිරිහැර කරන බව හෝ උ ගැන සොයා නොබලන බව හෝ සභාපතිතුමාට ඒත්තුගියේනම් එක්කෝ,

(c) ඒ බල්ලා බෝවෙන හෝ පැතිරයන ලෙඩකින් පෙළෙමින් සිටියදී අනුන්ට අයිති වෙනත් බල්ලන් හා එකට ගැවසෙන්ට උ අයිතිකාරයා විසින් ඉඩහැරියේනම් මේ සහතිකය අවලංගුකරන්නට සනීපාරක්ෂක සභාවල සභාපතිතුමාට පුළුවන.

6. සහතිකයක් දෙන්නට බැරියකියනුලැබ හෝ දෙනලද සහතිකයක නියමයන් අනුව ක්‍රියානොකිරීම හේතුකොට ගෙන එය අවලංගුකරනුලැබ හෝ සිටින බල්ලකු හෝ බැල්ලියක් රැකබලාගෙන ඉන්නාක් හෝ අයිතිකාරයෙක් හෝ වීනම් ඔහු විසින් ඒ සඳහා දැන්වීමක් ලත්විට එහි සඳහන් වේලාවට සහ නියම ස්ථානයට ඒ බල්ලා හෝ බැල්ලී ගෙන ගොස් උන් බාරගන්ට බලය ලබාසිටින සභාවල නිලධාරියකුට බාරදිය යුතුයි. එවිට එබඳු බල්ලන් සම්බන්ධව සභාපතිතුමා නියමකරන පරිද්දෙන් ක්‍රියාකරනු ලැබේ.

## A.—ආකෘති පත්‍රයයි.

### බල්ලන් සම්බන්ධ උපනීතිවල නියමිත ලේඛනයයි.

ගෙදර අංකය : ——.

වීදිය : ——.

ගෙහිමියාගේ නම : ——.

| තබාගෙන සිටින බලපත්‍රයේ ගණන. | විස්තර. | | | | | | අයිතිකාරයාගේ නම. | * ගාස්තුව ගෙවූ දිනය. |
|---|---|---|---|---|---|---|---|---|
| | ජාතිය. | පිරිමි සතාද, ගැහැනු සතාද. | පාට. | බෙල්ලේ මහත. | විශේෂ ලකුණු. | වැඩිපුර කරුණු. | | |
| | | | | | | | | මාර්තු මස 31වෙනිදා හෝ ඊට පෙර. |

ආකෘති පත්‍රය බාරදුන් දවස : ——.

——,
ගෙහිමියාගේ අත්සන.

ඉහත සඳහන් ගෙහිමියා විසින් ඉහත සඳහන් පැවුල්පත්‍රය හරවා, සතියක් ඇතුලත එවිය යුතුයි. එසේ නොකර පැහැර හරින යම් කෙනෙක් විනම් ඒ අය රු. 20ක දඩයකට යටත් වියහැක.

——,
සභාපතිතුමා.

193 —— ක්වූ —————— මස —— දින
පුත්තලම් කච්චේරියේදීය.

## B.—ආකෘති පත්‍රයයි.

### බල්ලන් ලියාපදිංචිකිරීමේ සහතිකය.

වීදිය : ——.

ලියාපදිංචිකිරීමේ අංකය : ——.

ගෘහයෙහි වාසයකරණ — ———, විසින් පහත සඳහන් විස්තර ඇති බල්ලකු/බැල්ලියක් මේ කන්තෝරුවෙහි ලියාපදිංචි කළබවද, ඊට නියම ගාස්තුවවූ ශත —— ගෙවූබවද මෙසින් සහතිකරමි.

බල්ලාගේ/බැල්ලීගේ විස්තර.

ජාතිය : ——.

පිරිමි සතාද ගෑනු සතාද යන වග : ——.

පාට : ——.

බෙල්ලේ මහත : ——.

විශේෂ ලකුණු : ——.

මේ සහතිකය වර්ෂ 19 —— මාර්තු මස 31වෙනිදා වනතුරු බල සහිතව පැවතේ.

——,
සභාපතිතුමා.

වර්ෂ 193 — ක්වූ —————— මස —— වෙනි දින
පුත්තලම් කච්චේරියේදීය.

---

## ඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම්.

### 1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

### නිරවුල්කිරීමේ දැන්වීම නො. 1,353 (කුරුණෑගල).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම් වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වර්ෂ 1936ක්වූ ජූලි මස 31වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරණ මාවෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරණුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඊට කටයුතුකරණ බවද එකී ආඥාපණතේ 4වෙනි වගන්තිය යටතේ මෙසින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1936ක්වූ ජූනි මස 11වෙනි දින කුරුණෑගල කච්චේරියේදීය.

එච්. සී. කොක්ස්,
කුරුණෑගල දිස්ත්‍රික්කේ ආණ්ඩුවේ
උප ඒජන්තතුමා.

(*a*) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු වයඹ දිසාවේ මහ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම් කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම් වලට අයිතිකම් කීම හැටියට භාරගනු ලැබේ.

#### උප ලේඛනය.

මෙහි පහත සඳහන් බිම්කැබලි වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ වන්නිහත්පත්තුවේ මීඔයෙන් එගොඩකෝරළේ රජන්ගනේ (පාලු) ගල්කඩවල පිහිටා තිබේ.

නො. A 256 දරණ මුල් සිතියම.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. | | |
|---|---|---|---|---|
| 1 | රජන්ගනේමූකලාන .. | 8 | 2 | 19 |
| 2 | එම .. | 16 | 3 | 10 |
| | | 25 | 1 | 29 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව උරුමකියන රජන්ගනේ මූකලාන ; නැගෙණහිරට ආණ්ඩුව උරුමකියන රජන්ගනේ ෆේනද, ආණ්ඩුව උරුමකියන රජන්ගනේමූකලානද ; දකුණට ආණ්ඩුව උරුමකියන රජන්ගනේමූකලානද, ගල්කඩවල ගම්ඉමද ; බස්නාහිරට ගල්කඩවල ගම්ඉමද, ආර්. මැණික් හාමිට සහ තවත් අයට අයිති නො. 203,468 දරණ පිඹුරේ සඳහන් ඉඩමද, ආණ්ඩුව උරුමකියන රජන්ගනේමූකලානද, ආණ්ඩුව උරුමකියන කිරීයගහකැලේද වෙත්.

---

### 1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

### නිරවුල්කිරීමේ දැන්වීම නො. 1,354 (කුරුණෑගල).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම් වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වර්ෂ 1936ක්වූ ජූලි මස 31වෙනි දින පටන් තුන් මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරන මාවෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනු ලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඊට කටයුතුකරන බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙසින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1936ක්වූ ජූනි මස 11වෙනි දින කුරුණෑගල කච්චේරියේදීය.

එච්. සී. කොක්ස්,
කුරුණෑගල දිස්ත්‍රික්කේ ආණ්ඩුවේ
උප ඒජන්තතුමා.

(*a*) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු වයඹ දිසාවේ මහ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම් කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම් වලට අයිතිකම් කීම හැටියට භාරගනු ලැබේ.

#### උප ලේඛනය.

මෙහි පහත සඳහන් බිම්කැබැල්ල වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ වන්නිහත්පත්තුවේ මීඔයෙන් එගොඩකෝරළේ ගල්කඩවල පිහිටා තිබේ.

නො. A 256 දරණ මුල් සිතියම.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. | | |
|---|---|---|---|---|
| 3 | රජන්ගනේමූකලාන .. | 3 | 1 | 0 |

මීට මායිම්—උතුරට රජන්ගනේ (පාලු) ගල්කඩවල ගම්ඉම සහ ආණ්ඩුව උරුමකියන රජන්ගනේමූකලානද ; නැගෙණහිරට, දකුණට සහ බස්නාහිරටත් ආණ්ඩුව උරුමකියන රජන්ගනේමූකලානද වෙත්.

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම්.

**Kurunegala, No. 233.**—වයඹ දිසාවේ කුරුණෑගල ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1936ක්වූ සැප්තැම්බර් මස 18වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 10ට නාරම්මල කානාසම්පලේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ දඹදෙනිහත්පත්තුවේ කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 33ක්.

නො. A 6 දරණ මුල් සිතියම. ගම—රුකෝපත්තුකෝරළේ ගලබොඩගම. අයිතිකම්කියන්නා—ආණ්ඩුව සහ නැසීගිය ආර්. බී. ඉලන්කෝන්ගේ බූදලේ බලකාරිවන ජේ. ඇම්. සිව්වම්මා කුමාරිහාමි.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිළ, රු. |
|---|---|---|---|---|---|---|---|
| 7 | පන්වත්ත .. | — | .. පොල්වතත, තාවකාලික ගෙයක් තිබේ | 1 | 2 | 28 | 10 |

නො. 5,551 දරණ මුල් සිතියම. ගම—එම කෝරළේ උඩුගම. අයිතිකම්කියන්නා—ආණ්ඩුව.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 5 | කෝන්ගහලිදකන්දේමූකලාන | ජේ. ඒ. දෙන් චාර්ලිස් සිඤ්ඤෝ | මූකලාන .. | 2 | 3 | 6 | 55 |

නො. 5,795 දරණ මුල් සිතියම. ගම—එම කෝරළේ මකුල්ඔලුව. අයිතිකම්කියන්නා—ආණ්ඩුව සහ ඩබ්ලිව්. ඒ. පිනා සහ ජේ. ඇම්. පුංචිඅප්පුහාමි.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 10 | මාවත්තගෙන්නේවත්ත .. | — | .. පොල්වත්ත .. | 2 | 0 | 12 | 10 |

නො. 6,325 දරණ මුල් සිතියම. ගම—එම කෝරළේ තම්මිට. අයිතිකම්කියන්නා—ආණ්ඩුව, ඊ. ඇම්. මැන්ඩිස්මහත්මි, රන්බණ්ඩා, කිරිමැණිකා, හිංගිරිඅම්මා සහ ඇක්කම්මා කුමාරිහාමි.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 8 | කොටුවේහේන සහ ඇටඹුරුගොල්ලේහේන | — | .. පොල්වත්ත .. | 2 | 3 | 9 | 16* |

අයිතිකම්කියන්නා—ආණ්ඩුව සහ ඊ. ඇම්. මැන්ඩිස් මහත්මි.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 10 | කොටුවේහේන සහ පහලපව්ව හේන | — | .. හේන .. | 0 | 2 | 35 | 16 |
| 10A | එම .. | — | .. එම .. | 0 | 1 | 5 | 16 |

නො. 6,338 දරණ මුල් සිතියම. ගම—එම කෝරළේ උඩුගම. අයිතිකම්කියන්නා—ආණ්ඩුව.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | කරවිගහමුලහේන .. | ජේ. දෙන් චාර්ලිස් සිඤ්ඤෝ සහ ජේ. දෙන් ජේම්ස් සිඤ්ඤෝ | ලඳුකැලෑව .. | 8 | 0 | 37 | 50 |

නො. 7,276 දරණ මුල් සිතියම. ගම—එම කෝරළේ මකුල්ඔලුව.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 8 | කහටගහමුලපිල්ලෑව .. | — | .. පොල්වතත, (ඩබ්ලිව්. ඒ. සාමෙල් අප්පුවා සහ ඩබ්ලිව්. ඒ. පීටර් සිඤ්ඤෝ යනඅය වෙනුවට ඔවුන්ගේ බාරකාරයාවන ඩබ්ලිව්. ඒ. රනා විසින් බුත්තියට ගෙනතිබේ) | 0 | 1 | 32 | 10* |
| 14 | රුක්ගහකුඹුරේපිල්ලෑව .. | — | .. අලුත එලිකරතිබේ, (ජේ. ඇම්. කිරිබණ්ඩා සහ ඩබ්ලිව්. ඒ. සාමෙල් අප්පු යනඅය වෙනුවට ඔවුන්ගේ බාරකාරයාවන ඩබ්ලිව්. ඒ. රනා විසින් බුත්තියට ගෙනතිබේ) | 0 | 0 | 37 | 10* |

නො. 7,738 දරණ මුල් සිතියම. ගම—එම කෝරළේ උහුමිය.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | රත්මලගහපිටිය .. | — | .. පොල්වත්ත, (ඇන්. පෙරේරා විසින් බුත්තියට ගෙනතිබේ) | 0 | 1 | 36 | 16 |
| 2 | එම .. | — | .. පොල්වතත, (පී. බී. තෙන්නකෝන් විසින් බුත්තියට ගෙනතිබේ) | 0 | 0 | 36 | 10 |
| 9 | අස්වැද්දුමේහේන .. | — | .. වත්ත, (අයි. ඇම්. උක්කුබණ්ඩා විසින් බුත්තියට ගෙන තිබේ | 1 | 1 | 0 | 65 |

නො. 239 දරණ අවසාන සිතියම. ගම—උඩුකහ බස්නාහිරකෝරළේ මැව්යගෙන්.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 9F | මිහිකුකුලේවත්ත .. | — | .. පොල්වතත, (ඩබ්ලිව්. පී. කාසිච්චි විසින් බුත්තියට ගෙන තිබේ) | 0 | 0 | 6 | 85 |

නො. 550 දරන අවසාන සිතියම. ගම—එම කෝරළේ පැලවත්ත.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 39 | විල්පිටියමූකලාන .. | බම්බලපිටියේ ඒ. පී. ගුණතිලක | පොල්වත්ත .. | 1 | 0 | 33 | 60 |
| 40 | එම .. | එම .. | එම .. | 12 | 3 | 20 | 60 |
| 44 | විල්පිටියමුලමූකලාන .. | එම .. | එම .. | 1 | 2 | 36 | 60 |

නො. 558 දරණ අවසාන සිතියම. ගම—එම කෝරළේ ඊලිගල.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 21c18 | පේරගොලහේනවත්ත .. | — | .. වත්ත, (ඇස්. ඒ. කිරිමැනිකා විසින් බුත්තියට ගෙන තිබේ) | 0 | 0 | 20 | 200*† |

නො. 566 දරණ අවසාන සිතියම. ගම—එම කෝරළේ පරනගම.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 31D | මොරගොල්ලේමූකලාන නොහොත් මොරගොලෙලවතත | — | .. පොල්වතත, (ඒ. අප්පුහාමි විසින් බුත්තියට ගෙන තිබේ) | 0 | 1 | 20 | 42·50 |

නො. 7,174 දරණ මුල් සිතියම. ගම—උඩුකහ උතුරුකෝරළේ බැදිගමුව. අයිතිකම්න්යන්නා— ආණ්ඩුව සහ කේ. පී. උක්කුමැනිකා.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | හිටිනාවත්තඉස්මත්ත .. | — | .. හේන .. | 0 | 2 | 4 | 15 |

නො. 7,175 දරණ මුල් සිතියම. ගම—එම කෝරළේ බැදිගොමුව. අයිතිකම්කියන්නා—ආණ්ඩුව, පී. බී. ගමි, කිරා, හපුවා සහ මොහොතා.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | කෝන්ගහමුලහේන .. | — | .. හේන .. | 1 | 0 | 5 | 10* |
| 4 | එම .. | — | .. එම .. | 0 | 0 | 18 | 10* |

අයිතිකම්කියන්නා—ආණ්ඩුව, කේ. රන්හාමි, පෙතන්හාමි, බන්ඩිරාල සහ පින්හාමි.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 5 | කෝන්ගහමුලහේන නොහොත් අඹිපිල්ලගහමුලහේන | — | .. හේන .. | 1 | 0 | 19 | 10* |

අයිතිකම්කියන්නා—ආණ්ඩුව සහ කේ. වී. අප්පුහාමි.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 7 | බෝගහමුලහේන .. | — | .. හේන .. | 0 | 1 | 12 | 10* |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| | නො. 232 දරණ අවසාන සිතියම. ගම—එම කෝරළේ පහල මැදගොඩ. අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | | |
| 16 | අලියාවැටිච්චිහේන .. | දිවුලාපිටියේ ඩී. බී. ජයකොඩි | පොල්වත්ත .. | .. 10 1 37 | 110 |
| 19A | අලියාවැටිච්චිහේන නොහොත් බලියාදෙනියමූකලාන | එම .. | එම .. | .. 0 0 22 | 110 |
| | නො. 12 දරණ අවසාන සිතියම. ගම—මයුරවතීකෝරළේ පනාවිටිය. | | | | |
| 21L | මැදපොලවත්ත .. | — .. | පොල්වත්ත, (එච්. බී. ඩිංගිරිඅප්පු හාමි සහ තවත් කෙනෙක් විසින් බුත්තියට ගෙන තිබේ) | 0 1 4 | 110 |
| 21M | එම .. | — .. | එම ( එම ) .. | 0 0 10 | 110 |
| 21N | කොස්ගහමූලහේනේවත්ත .. | — .. | පොල්වත්ත, (ඩිංගිරිබණ්ඩා හිටපු කෝරාල විසින් බුත්තියට ගෙන තිබේ) | 0 1 8 | 110 |
| | නො. 214 දරණ අවසාන සිතියම. ගම—එම කෝරළේ රත්නැහැරුව. | | | | |
| 8F1 | කෝන්ගහමූලවත්ත .. | — .. | පොල්වතත, (ඇස්. ඒ. ප්‍රන්සිස් සිල්වා විසින් බුත්තියට ගෙන තිබේ) | 0 2 32 | 70‡ |
| | නො. 924 දරණ අවසාන සිතියම. ගම—එම කෝරළේ පිටදෙනිය. | | | | |
| 26C | ගලගෙදරමූකලාන .. | කොළඹ බිෂොප් උන්නාන්සේ වෙනුවට ජේ. මැජෝරල් ස්වාමි | මූකලාන .. | .. 2 3 35 | 75 |
| | නො. 934 දරණ අවසාන සිතියම. ගම—එම කෝරළේ එලුවාපොල. | | | | |
| 12A | දෙල්ගහමූලවත්ත .. | — .. | වත්ත, (පී. බන්ඩියා විසින් බුත්තියට ගෙන තිබේ) | 0 0 31 | 80* |
| | නො. 936 දරණ අවසාන සිතියම. ගම—එම කෝරළේ කන්දේගෙදර. | | | | |
| 5P | කහටගහමූලවත්ත .. | — .. | පොල්වතත, (ඇස්. ඒ. ඩිංගිරිමැනිකා විසින් බුත්තියට ගෙන තිබේ) | 0 0 34 | 85 |
| | නො. 938 දරණ අවසාන සිතියම. ගම—එම කෝරළේ නාවල්ලේ ගෙදර. | | | | |
| 16A | රුක්ගහමූලපිල්ලෑව .. | — .. | පොල්වත්ත, (එච්. පී. බී. හපු විසින් බුත්තියට ගෙන තිබේ) | 0 0 17 | 50 |

* නැවත ප්‍රසිඹකිරීමයි. † සියේට පහහත් කොමිස් අඩුකර දෙනු ලැබේ. ‡ මුර ඉඩමටම.

මේ ඉඩම් ගැන වැඩි විස්තර වයඹ දිසාවේ ඒජන්තතුමාගෙන්ද ඒවායේ සිතියම් සර්වේයර් ජනරල්තුමාගෙන්ද ලබාගත ගැකිවේ.

වර්ෂ 1936ක්වූ ජූලි මස 28වෙනි දින කොළඹ
ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමාගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වමින.

---

මෙහි පහත සඳහන්කරණ ආණ්ඩුව සන්තක ඉඩම් කැබැල්ල ආණ්ඩුවේ නියෝගවලට අනුව ඌව පළාතේ ආණ්ඩුවේ ඒජන්තඋන්නාන්සේ විසින් වර්ෂ 1936ක්වූ සැප්තැම්බර් මස 12වෙනි දින බදුළු කච්චේරියේදී පෙරවරු 10ට අවුරුදු 99 බද්දට නිරවුල්කර දෙනු ලැබේ.

බද්දේ කොන්දේසි ඌව පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඉඩමේ සිතියම් සර්වේයර් ජනරල්තුමාගෙන්ද ලබාගත හැක.

මුල් සිතියමේ නො. A 64. ගම—වියළුව බයපළාත කෝරළේ උඩ ඇල්ලේගම. විස්තර—මුඩුබිම, ගොඩනැගිලි කීපයක් සහ එළවලුකොටු කීපයක්ද තිබේ.

| බිම් කෑලි. | ඉඩමේ නම. | අයිතිකම්කියන්නා. | බිම්තරම, අ. රූ. ප. | වෙන්දේසිය පටන්ගන්න අක්කරයක ප්‍රමියම ගණන. රු. ශ. | පළමු තිස්අවුරුද්දට අක්කරයකට අවුරුද්දක බද්ද. එක එක පළමු සය අවුරුද්දට, රු. ශ. | එක එක ඉතිරි විසිහතර අවුරුද්දට, රු. ශ. |
|---|---|---|---|---|---|---|
| 1 | රෝබරිවත්ත .. | ආණ්ඩුව, ලංකාවේ සීමා සහිත රොබරි ෆෙත් කොම්පැනිය විසින් අයුක්තෙන් භුක්තිවිඳිනු ලැබේ | 11 3 6 .. | 117 88 .. | 35 36 .. | 35 36 |

වර්ෂ 1936ක්වූ ජූලි මස 28වෙනි දින කොළඹ ඉඩම්
පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වමින.

---

No. 11,966, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1936ක්වූ සැප්තැම්බර් මස 12වෙනි දිනවූ සෙනසුරාදා පෙරවරු 10ට කොළඹ ආණ්ඩුවේ ඉඩම් නිරවුල්කරන කන්තෝරුවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අනුමකින් තීන්දු කරන්ට යෝජනාවා ඇත. සබරගමු පලාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටිකෝරළේ උතුරු උඩපත්තුවේ කොඩාසගේ පිහිටා තිබෙන බිම්කැබලි 18ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 317. ගම—එල්ලාවල පහලගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කොස්කොලයායෙදනියලගහේන .. | පැල්මඩුල්ලේ පදිංචි චාර්ලස් එඩ්වඩ් පෙරේරා .. | අරත්වගාව .. | 2 2 7 |
| 3 | නාකවිගේහේන .. | එම .. | රබර් .. | 0 2 9 |
| 4 | කැලවිගේමූකලාන, ගලටඹමූකලාන | එම .. | අරත් වගාව .. | 4 1 38 |
| 33 | පිච්ටකන්දේවත්ත .. | එම .. | රබර් .. | 25 3 31 |
| 40 | එම .. | එම .. | එම .. | 2 2 35 |
| 41 | එම .. | එම .. | එම .. | 6 2 11 |
| 59 | ගලටඹමූකලාන, කලපිටියේමූකලාන | එම .. | ඝන කැලය .. | 10 0 17 |
| 68 | ඉදිම්පිටියවත්ත .. | එම .. | රබර් .. | 1 0 7 |
| 80 | පිච්ටකන්දේවත්ත, බොරළුගොඩහේනේවත්ත | එම .. | එම .. | 35 0 30 |
| 81 | පිච්ටකන්දේවත්ත .. | එම .. | එම .. | 0 3 25 |
| 83 | කොස්කොලයායෙදනියලගහේන .. | එම .. | එම .. | 0 3 28 |
| 84 | එම .. | එම .. | එම .. | 2 2 39 |
| 85 | වීස්සහේන, බඩහැලහේන .. | එම .. | එම .. | 16 1 4 |
| 86 | බඩහැලයාහේන .. | එම .. | එම .. | 3 1 26 |
| 89 | ගලපල්ලේහේන .. | එම .. | එම .. | 5 1 20 |
| 92 | පිටකන්දේවත්ත .. | එම .. | එම .. | 37 1 24 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකම්කියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 93 | දන්කැටියදෙලගාවමලපාලුව, කිරිගලහේනේමලපාලුව | පැල්මඩුල්ලේ පදිංචි චාර්ලස් එඩ්වඩ් පෙරේරා .. | රබර් .. | 8 3 7 |
| 94 | කිරිගලහේනේමලපාලුව .. | එම .. | .. තනකැලය .. | 0 3 15 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වම් 1936ක්වූ ජූලි මස 29වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වම්හ.

---

**No. 11,967, S. O.**—ඉඩම් නිරවුල්කරණ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වම් 1936ක්වූ සැප්තැම්බර් මස 12වෙනි දිනවූ සෙනසුරාදා පෙරවරු 10ට කොළඹ ආණ්ඩුවේ ඉඩම් නිරවුල් කරන කන්තෝරුවේදී තමන්දේසිකාර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෝදනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කේ කුරුවිටිකෝරලේ උතුරු උඩපත්තුවේ කොටසයේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 252. ගම—එල්ලාවල ඉහලගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකම්කියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 427P | හොරගොල්ලේහේන්යාය කොස්ගහහේන | පැල්මඩුල්ලේ පදිංචි චාර්ලස් එඩ්වඩ් පෙරේරා .. | හේන සහ රබර් .. | 9 3 20 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ

මෙකී ඉඩම ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, එහි සිතියම කොළඹ සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වම් 1936ක්වූ ජූලි මස 29වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වම්හ.

---

**No. 11,968, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වම් 1936ක්වූ සැප්තැම්බර් මස 12වෙනි දිනවූ සෙනසුරාදා පෙරවරු 10ට කොළඹ ආණ්ඩුවේ ඉඩම් නිරවුල්කරන කන්තෝරුවේදී තමන්දේසිකාර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දු රන්ට යෝදනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කේ කුරුවිටිකෝරලේ උතුරු උඩපත්තුවේ කොටසයේ පිහිටා තිබෙන බිම්කැබලි 3ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 331. ගම—දෙහිපගල (කොටසක්).

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකම්කියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 87 | ගලපල්ලේහේන, පිටදෙනි මුල්ලේහේන යනාදිය | ගල්කිස්සේ එජ්කෝට් නිවසෙහි පදිංචි හැන්රි ඇඩ්වින් ද අල්විස් | හේන .. | 12 0 23 |
| 90 | යක්දුනගාවගොඩැල්ල .. | එම .. .. | .. රබර් .. | 2 0 0 |
| 174 | අත්කන්දේවත්තෙ හේන් යාය | ගල්කිස්සේ එජ්කෝට් නිවසෙහි පදිංචි හැන්රි ඇඩ්වින් ද අල්විස් බාරේ එමලි අමරසිරි ගුණවර්ධන | හේන .. | 7 0 13 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩි නොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරණ නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වම් 1936ක්වූ ජූලි මස 29වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වම්හ.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

වම් 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3 කේ ආඥාපත්‍රයේ සත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—කල්මුණේ සනීපාරක්ෂක සභාවට අයිති කඩවල වැඩිදියුණුවට සහ මස්කඩයක් ගොඩනැගීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වම් 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" සගවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 228. ගම—කල්මුණේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | fපියරීන්තෝට්ටම් .. | වත්තෙහි පොල්ගසක් සහ සුණෙන් බදිනලද ලිදක්ද තිබේ | කල්මුණේ වේලුපුල්ලේ රාමලිංගම් | 0 0 35·4 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කැපනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා සත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමූන්ම නොහොත් තමූන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1936ක්වූ අගෝස්තු මස 24වෙනි දින පෙරවරු 10යේ කනිසමට කල්මුණේ තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි ජාතියේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලා සිටින මුදල් ගනනත් ඊට ඇත්තාවූ තමූන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1936ක්වූ ජූලි මස 23වෙනි දින මඩකලපුව කච්චේරියේදීය.

සී. සින්නම්පලම්,
මඩකලපුවේ ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වම් 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3 කේ ආඥාපත්‍රයේ සත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වම් 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" සගවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩම්නම්:—

අඞ්ක 19 දරණ අන්තිම ගම්සිතියමට යාකරගත් අඞ්ක 1 දරණ සිතියම. ගම—නෙඩුන්කුඩා.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 57 | නෙඩුන්කුඩා වටවූ | පොල්වත්ත, අවුරුදු 60 වයසැති පොල්ගස් 21ද, අවුරුදු 15 වයසැති පොල්ගසක්ද, අවුරුදු 4ක් වයසැති පොල්පැල 76ද, අවුරුදු 50ක් වයසැති තල්ගස් 2ද, අවුරුදු 4ක් වයසැති පේරගස් 26ද, අවුරුදු 4ක් වයසැති දෙළුම්ගසක්ද, අවුරුදු 4ක් වයසැති අනමඳගස් 4ද, අවුරුදු 3ක් වයසැති කජුගස් 3ද, අවුරුදු 15ක් වයසැති සියඹලාගසක්ද, ඉරුංගාගස් 35ද, මැටිඋන්කල පොල්අතු සෙවිලිකරනලද ගෙයක්ද, තනරන් බිත්තිවලින් සහ පොල් අතුවලින් සෙවිලිකරනලද ගෙවල් 2ද, පොල්අතු සෙවිලිකරනලද ගෙයක්ද, පොල්අතු සෙවිලිකරනලද පැලවල් 2ද තිබේ | නෙඩුන්කුඩා යන ගම පදිංචි මදූර් මොහමදු කාසිම් | 0 2 22·1 |

| අංක. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයන්ගේ නම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 58 | නෙඩුන්කුඩාවලවු | පොල්වත්ත, අවුරුදු 60ක් වයසැති පොල්ගස් 5ද, අවුරුදු 4ක් වයසැති පොල්පැල 4ද, අවුරුදු 1ක් වයසැති පොල්පැල 59ද, අවුරුදු 25ක් වයසැති සියඹලාගස් 4ද, අවුරුදු 2ක් වයසැති කොස්ගස් 3ද, අවුරුදු 2 වයසැති අඹගස් 4ද, පදිංචි ගෙයක්ද, කඩයක්ද තිබේ | නෙඩුන්කුඩා යන ගම පදිංචි (1) සෙයිලාබුදීන් ජෙයිනුදීන් සහ (2) ඉස්මයිල් සායිබුගේ භාර්යාව වන කිවිල් උම්මා | 0 | 2 | 33·6 |
| 59 | එම .. | පොල්වත්ත, අවුරුදු 40ක් වයසැති පොල්ගස් 23ද, අවුරුදු 1 සිට 2 දක්වා වයසැති පොල්පැල 43ද, අවුරුදු 40ක් වයසැති තල්ගස් 4ද, මුරුංගාගස් 4ද, පොල්අතු සෙවිලිකල ගෙයක්ද, පොල්අතු සෙවිලි කල පැලක්ද තිබේ | නෙඩුන්කුඩා යන ගම පදිංචි මදූර් හබීසාඋම්මා | 0 | 1 | 20 |
| 60 | නෙඩුන්කුඩා තෝට්ටම | හේන .. .. .. | (1) වෙප්පන්කුඩා යන ගම පදිංචි මොහම්මදු තයියර් මුස්තාෆා කසිදීන්, (2) චීනවරයේ පදිංචි හමුතුලෙව්වේ හජ්ජාර්උම්මා (3) චීනවරයේ පදිංචි හමුතුලෙව්වේ ජමාල්දීන්, (4) කාවඩිකුඩාවේ පදිංචි රජුබු අබ්බාස් | 0 | 0 | 11 |
| 61 | එම .. | පොල්වත්ත, (පාලු) අවුරුදු 50 සිට 60 දක්වා වයසැති පොල්ගස් 14ද, අවුරුදු 40ක් වයසැති තල්ගසක්ද, අවුරුදු 25ක් වයසැති සියඹලාගස් 3ද, අවුරුදු 40ක් වයසැති මුරුතගසක්ද තිබේ | (1) වෙප්පන්කුඩාවේ පදිංචි මොහමිමදු තයියර් මුස්තාපා කසීදීන්, (2) චීනවරයේ පදිංචි හමුතුලෙව්වේ හජ්ජර්උම්මා, (3) චීනවරයේ පදිංචි හමුතුලෙව්වේ ජමාල්දීන්, (4) කාවඩිකුඩාවේ පදිංචි රජුබුඅබ්බාස් | 0 | 3 | 20·6 |
| 62 | එම .. | පොල්වත්ත (පාලු) අවුරුදු 60ක් වයසැති පොල්ගස් 3ද, අවුරුදු 40ක් වයසැති තල්ගස් 2ද, අවුරුදු 25ක් වයසැති සියඹලාගස් 3ද, අවුරුදු 10ක් වයසැති සියඹලාගස් 3ද, අවුරුදු 10ක් වයසැති මුරුතගස් 2ද තිබේ | (1) නාවිච්කුඩාවේ පදිංචි වාවා ඉස්මයිල්, (2) මකිලඩි උත්තුවේ පදිංචි වාවා මුහම්මදු ඉබ්‍රාහිම්, (3) මකිලඩි උත්තුවේ පදිංචි විතුරුම්මා, (4) මකිලඩිඋත්තුවේ පදිංචි මෙයියදීන් නාච්චියා | 0 | 2 | 38 |
| 63 | එම .. | පොල්වත්ත (පාලු) අවුරුදු 50ක් වයසැති පොල්ගස් 3ද, අවුරුදු 40ක් වයසැති තල්ගස් 14ද, අවුරුදු 40ක් වයසැති සියඹලාගස් 3ද, අවුරුදු 5 සිට 8 දක්වා වයසැති මුරුතගස් 8ද තිබේ | (1) වෙප්පන්කුඩාවේ පදිංචි මුහම්මදු තයියර් මුස්තාපා කසිදීන්, (2) චීනවරයේ පදිංචි හමුතුලෙව්වේ හජ්ජර් උම්මා, (3) චීනවරයේ පදිංචි හමුතුලෙව්වේ ජමල්දීන්, (4) කාවඩිකුඩාවේ පදිංචි රජුබු අබ්බාස් | 0 | 2 | 34 |
| 64 | එම .. | හේන, අවුරුදු 50 වයසැති පොල්ගසක් තිබේ .. | (1) වෙප්පන්කුඩාවේ පදිංචි මොහම්මදු තයියර් මුස්තාෆා කසිදීන්, (2) චීනවරයේ පදිංචි හමුතුලෙව්වේ හජ්ජාර්උම්මා, (3) චීනවරයේ පදිංචි හමුතුලෙව්වේ ජමාල්දීන්, (4) කාවඩිකුඩාවේ පදිංචි රජුබුඅබ්බාස් | 0 | 0 | 38 |

අඞ්ක 21 දරන අන්තිම ගම් සිතියමට යාකරගත් අඞ්ක 1 දරන සිතියම. ගම—නාවිච්කුඩා.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 234 | සින්නකුලම් පිසව ලින්ගම් තෝට්ටම් | පොල්වත්ත, අවුරුදු 20ක් වයසැති පොල්ගස් 31ද, අවුරුදු 2 සිට 3 දක්වා වයසැති පොල්පැල 23ද, අවුරුදු 30 සිට 40 දක්වා වයසැති තල්ගස් 15ද, කටුකම්බි වැටක්ද තිබේ | ත්‍රිකුණාමලේ පදිංචි ඇල්. එච්. ඇල්. නොනිස් ද සිල්වා | 1 | 1 | 30 |
| 235 | නාවිච්කුඩාතෝට්ටම් | පොල්වත්ත, අවුරුදු 60ක් වයසැති පොල්ගස් 16ද, අවුරුදු 20ක් වයසැති පොල්ගස් 75ද, අවුරුදු 50ක් වයසැති තල්ගස් 40ද, අවුරුදු 8ක් වයසැති තල්ගස් 8ද, අවුරුදු 20ක් වයසැති සියඹලාගස් 4ද, අවුරුදු 10ක් වයසැති සියඹලාගසක්ද, අවුරුදු 20ක් වයසැති කජුගසක්ද, පොල්අතු සෙවිලිකරනලද පැලවල් 2ද, කටුකම්බි වැටක්ද තිබේ | ත්‍රිකුණාමලේ නො. 7 කොට්ඨාසයේ පදිංචි (1) මුහම්මදු නාච්චියා (අබ්දුල් රසක් අලිම්ගේ වැන්දඹු ස්ත්‍රී), (2) අබ්දුල් රසක් අලිම් මුහම්මදු අබුබක්කර්, (3) අබ්දුල් රසක් අලිම් පතිලඋම්මා | 2 | 1 | 11·2 |
| 236 | එම .. | වත්ත, අවුරුදු 50ක් වයසැති පොල්ගසක්ද, අවුරුදු 1 සිට 5 දක්වා වයසැති පොල්පැල 4ද, අවුරුදු 50ක් වයසැති තල්ගස් 13ද, මුරුංගාගස් 5ද, අවුරුදු 3ක් වයසැති දෙලුම්ගස් 1ද, පොල්අතු සෙවිලිකරනලද පැලවල් 3ද තිබේ | නාවිච්කුඩාවේ පදිංචි බාවා කාසිම් අබ්දුල් ලතීෆ් | 0 | 3 | 20·5 |
| 237 | එම .. | වත්ත, අවුරුදු 50ක් වයසැති තල්ගස් 2ද, පොල් අතු සෙවිලිකරනලද පැලක්ද තිබේ | නො. 7 දරන ත්‍රිකුණාමල වට්ටමේ (1) මොහමමදු නාච්චියා (අබ්දුල් රසාක් අලිම්ගේ වැන්දඹු ස්ත්‍රිය), (2) අබ්දුල් රසක් අලිම් අබුබකර්, (3) අබ්දුල් රසක් අලිම් පත්තිලඋම්මා | 0 | 0 | 33·6 |
| 238 | එම .. | වත්ත, අවුරුදු 50ක් වයසැති පොල්ගස් 6ද, අවුරුදු 5ක් වයසැති පොල්පැල 5ද, පොල්අතු සෙවිලි කරනලද පැලක්ද තිබේ | නාවිච්කුඩාවේ පදිංචි (1) මොහිදීන් බාවා, ජලල්දීන්, (2) මොහිදීන් බාවා අබ්දුල් ජබාර්, (3) මොහිදීන් බාවා සම්සුදීන්, (4) මොහිදීන් බාවා වරීයම් බී.බී., (5) මොහිදීන් බාවා රුකිඋම්මා, | 0 | 0 | 11 |

| නො. | ඉඩමේ නම. | අනුම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 239 | නාච්චිකුඩාතෝට්ටම් | වත්ත, අවුරුදු 40ක් වයසැති පොල්ගස් 6ද, අවුරුදු 6ක් වයසැති පොල්ගස් 27ද, අවුරුදු 50ක් වයසැති තල්ගස් 6ද, දෙහිගස් 1ද, මුරුංගාගස් 2ද, මැටි යෙන්කල පොල්අතු සෙවිලිකරනලද ගෙයක්ද, පොල්අතු සෙවිලිකරනලද පැලවල් 2ද, පොල්අතු මඩුවක්ද තිබේ | නාච්චිකුඩාවේ පදිංචි (1) අබ්දුල් බහාර් දීන්, (2) සෙයිනාඹු උම්මා (ජී. ජලල් දීන්ගේ භාර්‍යාව) | 0 1 18·7 |
| 240 | නාච්චිකුඩාවලවු .. | තල්වත්ත, අවුරුදු 50ක් වයසැති තල්ගස් 8ද, අවුරුදු 6ක් වයසැති පොල්ගස් 1ක්ද තිබේ | (1) ත්‍රිකුණාමලේ නො. 4 කොටාසයේ පදිංචි උදුමාන් උදුමා ලෙබ්බෙ, (2) ජේරාතුවේ පදිංචි පකීර් මුහම්මදු | 0 3 32·6 |
| 241 | නාච්චිකුඩාතෝට්ටම් | පොල්වත්ත, අවුරුදු 50ක් වයසැති පොල්ගස් 18ද, අවුරුදු 12 සිට 15 දක්වා වයසැති පොල්ගස් 102ද, අවුරුදු 5 සිට 7 දක්වා වයසැති පොල්ගස් 13ද, අවුරුදු 50ක් වයසැති තල්ගස් 24ක්ද, අවුරුදු 60ක් වයසැති සියඹලාගසක්ද, අවුරුදු 40 සිට 47 දක්වා වයසැති අඹගස් 3ක්ද, අවුරුදු 35ක් වයසැති කොසඹ ගසක්ද, මුරුංගාගස් 58ක්ද, පොල්අතු සෙවිලිකරනලද ගෙවල් 4ද, අර්ත්පාරේ කොටසක්ද, කටුකම්බිවැටක්ද, අවුරුදු 4ක් වයසැති කජුපැලයක්ද තිබේ | (1) ත්‍රිකුණාමලේ නො. 4වේ කොටාසයේ පදිංචි උදුමාන් උදුමාන්සා, (2) ජෙරතුවෙලියේ පදිංචි පකීර් මුහම්මදු | 2 1 28·2 |
| 242 | වන්නාන්වල්වු .. | හිස්මුඩුබිම, අවුරුදු 30ක් වයසැති තල්ගසක් සහ අර්ත්පාරේ කොටසක්ද තිබේ | ත්‍රිකුණාමලේ නො. 1 කොට්ඨාසයේ හබීදු බහාර්දීන් | 0 1 39·9 |
| 243 | එම .. | පල්ලිය සහ වත්ත, අවුරුදු 25ක් වයසැති අඹගසක්ද, අවුරුදු 15ක් වයසැති කොසඹ ගසක්ද, අර්ත්පාරේ කොටසක්ද තිබේ | ත්‍රිකුණාමලේ නො. 1 කොට්ඨාසයේ හබීදු බහාර්දීන් | 0 0 17·4 |
| 244 | නාච්චිකුඩාවලවු .. | පොල්වත්ත, අවුරුදු 50 සිට 60 දක්වා වයසැති පොල්ගස් 9ක්ද, අවුරුදු 10 සිට 20 දක්වා වයසැති පොල්ගස් 140ද, අවුරුදු 5ක් වයසැති පොල්පැල 7ක්ද, අවුරුදු 15ක් වයසැති කජුගස් 3ද, අවුරුදු 3ක් වයසැති කජුගසක්ද, අවුරුදු 2ක් වයසැති අඹපැලයක්ද, මුරුංගාගස් 9ක්ද, පොල්අතු සෙවිලිකරනලද ගෙයක්ද, පොල්අතු සෙවිලිකරනලද මඩුවක්ද තිබේ | ත්‍රිකුණාමලේ නො. 4 කොට්ඨාසයේ පදිංචි උදුමාන් උදුමාන්සා | 1 2 25·3 |
| 245 | එම .. | වත්ත, අවුරුදු 60ක් වයසැති පොල් ගසක් තිබේ | මකිලඩිඋත්තුවේ පදිංචි හනීපා උම්මා (රජබුරසක්ගේ භාර්‍යාව) | 0 1 25 |
| 246 | එම .. | වත්ත, අවුරුදු 50ක් වයසැති පොල්ගස් 5ද, පොල්අතු සෙවිලිකරනලද ගෙයක්ද තිබේ | නාච්චිකුඩාවේ පදිංචි අබ්දුල් බහාර්දීන් | 0 0 18·8 |
| 247 | එම .. | හිස්මුඩුබිම, අවුරුදු 15ක් වයසැති කොසඹගස් 2ක් තිබේ | නාච්චිකුඩාවේ පදිංචි අබ්දුල් බහාර්දීන් | 0 3 16 |
| 248 | එම .. | පොල්වත්ත, අවුරුදු 50 සිට 60 දක්වා වයසැති පොල්ගස් 17ක්ද, අවුරුදු 20 සිට 25 දක්වා වයසැති පොල්ගස් 24ද, අවුරුදු 3 සිට 5 දක්වා වයසැති පොල්පැල 24ද, අවුරුද්දක් වයසැති පොල්පැල 22ද, අවුරුදු 50ක් වයසැති තල්ගස් 2ද, අවුරුදු 10යක් වයසැති කොසඹගසක්ද, අවුරුදු 8 සිට 10 දක්වා වයසැති දෙඹගස් 2ද, පොල්අතු සෙවිලිකරනලද මැටිගෙනක්ද, පොල්අතු සෙවිලිකරනලද මඩු දෙකක්ද තිබේ | (1) නාච්චිකුඩාවේ පදිංචි කාදර් සයිබු පකීර්තම්බි, (2) නාච්චිකුඩාවේ පදිංචි අබ්දුල් බහාර්දීන් | 1 0 23·2 |
| 249 | එම .. | පොල්වත්ත, අවුරුදු 60ක් වයසැති පොල්ගස් 2ද, අවුරුදු 1ක් වයසැති පොල්පැල 53ද, අවුරුදු 15ක් වයසැති කොසඹගසක්ද, කටුකම්බි වැටක්ද තිබේ | චීනවරාගේ පදිංචි මදර්සා ලෙබ්බෙ ලබ්බෙදීන් | 0 2 22 |
| 250 | එම .. | පොල්වත්ත, අවුරුදු 3ක් වයසැති පොල්පැල 43ද, අවුරුදු 3ක් වයසැති කජුපැල 2ද, අවුරුදු 2ක් වයසැති කොස්පැල 1ද, මුරුංගාගස් 12ද, පැලක්ද තිබේ | නාච්චිකුඩාවේ පදිංචි පකීර් පිච්චතම්බි | 0 2 24 |
| 251 | කරච්චිවායල් .. | කුඹුර (පාලු) අවුරුදු 50ක් වයසැති තල්ගසක් හා සිමෙන්තියෙන්කල ළිඳක්ද තිබේ | ත්‍රිකුණාමලේ අතිගෞරවනීය ගැස්ටන් රොබට් ඇස්. ජේ. බිෂොප් උන්නාන්සේ | 9 1 29·6 |
| 252 | වණ්නාකර්නිවලවු | තල්වත්ත, (පාලු) අවුරුදු 50ක් වයසැති තල්ගස් 8ද, අවුරුදු 45ක් වයසැති සියඹලාගසක්ද තිබේ | එම .. | 0 2 16·6 |
| 253 | පල්ලිවාසල්කාඩු .. | කලෑව .. .. .. | (1) මකිලඩිඋත්තුවේ පදිංචි ඇල්. අම්. ඇස්. මුහම්මදු මදර්, (2) කින්නියාවේ පදිංචි ඇල්. ඇම්. ඇස්. මුහඳුමමසෙරිෆ්, (3) නාච්චිකුඩාවේ පදිංචි ඇල්. ඇම්. ඇස්. කාතුම් බී. බී. | 0 1 27 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකරතිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වන් 1936ක්වූ අගෝස්තු මස 28වෙනි දින පෙරවරු 10 කාලයටට ත්‍රිකුණාමලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අනුවේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වන් 1936ක්වූ ජූලි මස 23වෙනි දින
ත්‍රිකුණාමලේ කච්චේරියේදීය.

සී. ඊ. ජෝන්ස්,
ආණ්ඩුවේ උප ඒජන්ත වන්නේ.

## ටැණ්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

### දැව සැපයීමට අයකරණ මිල.

මෙහි පහත සඳහන් දැව කඳන් වශයෙන් (a) කොළඹ වැලිකඩ සිරගෙට සහ (b) නුවර බෝගම්බර සිරගෙටද සැපයීමට අයකරණ මිල ලේඛන මෙයින් ඉල්ලුම් කරනු ලැබේ. ගෙනර්ණේ සහ පැටවීමේ, බෑමේ, කුලියත් මිල ගනන්වලට අඩංගුවිය යුතුයි.

(a) වැලිකඩ සිරගෙට : බුරුත ඝන අඩි 1,500, කොස් ඝන අඩි 2,000, සූරියමාර ඝන අඩි 500, හැලඹ ඝන අඩි 300, කොළොන් ඝන අඩි 200, හුලන්හික් ඝන අඩි 200 සහ හල්මිල්ල ඝන අඩි 100යි.

(b) බෝගම්බර සිරගෙට : බුරුත ඝන අඩි 1,000, කොස් ඝන අඩි 750 සහ ලුනුමිදෙල්ල ඝන අඩි 200යි.

මිල ලේඛන 1936ක්වූ අගෝස්තු මස 26වෙනි දින දහවල් 12ට පෙර සිරගෙවල ඉන්ස්පැක්ටර් ජනරාල්තුමාගේ "බ්‍රාන්ච් ප්‍රිසන් ඉන්ඩස්ට්‍රීස්" නමැති කන්තෝරුවට ලැබිය යුතුයි. ආණ්ඩුවේ මුදල් භාණ්ඩාගාරයට හෝ කච්චේරියට රුපියල් 10ක් ගෙවා ලැබුන කුවිතාන්සියක් සමග ඉල්ලුම්පත්‍රයකින් සිරගෙවල ඉන්ස්පැක්ටර් ජනරාල්තුමාගෙන් ලබාගත් "ෆෝර්ම" කොළවලින්ම මිල ලේඛන දැන්විය යුතුයි. මේ පිළිබඳ වෙනත් සියලු විස්තර ඉන්ස්පැක්ටර් ජනරාල්තුමාගෙන් ලබාගත හැක.

C. C. SCHOKMAN,
සිරගෙවල ඉන්ස්පැක්ටර් ජනරාල්තුමා.

මේ 1936ක්වූ ජූලි මස 20වෙනි දින සිරගෙවල ඉන්ස්පැක්ටර් ජනරාල්තුමාගේ "බ්‍රාන්ච් ප්‍රිසන් ඉන්ඩස්ට්‍රීස්" නමැති කොළඹ කන්තෝරුවේදීය.

## 1920සේ කොම්මර 11 දරණ ප්‍රදේශික ආණ්ඩු ව්‍යවස්ථාව.

### මීගමුවේ නගරබද දිස්ත්‍රික් සභාවේ සාමාජිකයින් තේරීම, 1936.

ඉහතකී නගරබද දිස්ත්‍රික් සභාවේ සාමාජිකයින් වශයෙන් තෝරාපත්කිරීමට සුදුසුකම් ඇති අයවළුන්ගේ නාමලේඛන සහ ඡන්දය දීමට සුදුසුකම්ඇති ඡන්දදායකයින්ගේ නාමලේඛනද, මීගමුවේ නගරබද දිස්ත්‍රික් සභා කාර්යාලයේ කටයුතුකරණ කාලය තුලදී එම ලේඛන උවමනා අයවළුන්ට පරීක්ෂාකිරීමට ඉඩතිබේ.

තවද 1936සේ සැප්තැම්බර් මස 9වෙනි දින උදේ 10ට බස්නාහිර පළාතේ දිසාපතිතුමා ඉහතකී නාමලේඛනවල ඇතුළත්කරතිබෙන නාමවලට විරුඬව කියයුතු කරුණු ඇසීමටද, දැනට පිළියෙලකරතිබෙන නාමලේඛනවලට අලුත නම් ඇතුලත් කිරීමට සුදුසුකම් ආදිය ඇසීම පිණිසද ඉහතකී නගරබද දිස්ත්‍රික්සභා කාර්යාලයට පැමිණෙනවා ඇත.

1920, 11 ආඥාපණතේ 29 (3) වගන්තිය විශේෂයෙන් සැලකිය යුතුයි.

එකී වගන්තියට අනුව දැනට නාමලේඛනවලට ඇතුළත් කරතිබෙන නමකට විරුඬකම් ඇතිවුවොත් විරුඬකම් සටහන් කර දැන්වීමක් විරුඬකම් පාන්නා විසින් එවන්ට ඕනෑවා සහ එම දැන්වීම් මෙහි පහත අත්සන්කරණ අය විසින් විරුඬකම් සහ අයිතිකම් ආදිය ගැන විසඳීමට සත්දිනකට පෙර විරුඬකම ලබන්නන්වෙත භාරදිය යුතුයි. එහෙයින් එවැනි දැන්වීම් මෙහි පහත අත්සන්කරණ අයවෙත 1936 අගෝස්තු මස 25වෙනි දිනට ප්‍රථම ලැබෙන්ට කල් ඇතුව එවිය යුතුයි. එසේ දැන්වීම් කලින් එවියයුත්තේ ඉහතකී වගන්තියේ ප්‍රකාර නිසිකලට දැන්වීම් භාරදීම උවමනා හෙයිනි.

ආර්. ඇම්. ඇම්. වර්ස්ලි.
බස්නාහිර පළාතේ දිසාපතිතුමා.

මේ 1936ක්වූ ජූලි මස 27වෙනි දින කොළඹ කච්චේරියේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.